සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

| 21 | S | I,II |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය 2020
Third Term Test 2020

| 11 ශ්‍රේණිය<br>Grade 11 | සිංහල භාෂාව හා සාහිත්‍යය - I,II<br>Sinhala language and literature - I,II | පැය තුනයි<br>Three hours |
|---|---|---|

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

සැලකිය යුතුයි :

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කිරීමටත් යොදන්න.

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01 අයියා **ඇවිත් ආපයින් ම** ගිය එක ගැන අම්මා නොසතුටින් කතා කළේ ය.
(1) නොසතුටින් ආපසු යාම (2) පැමිණි වාහනයෙන් ම ආපසු යාම
(3) පැමිණි ආකාරයට ම ආපසු යාම (4) ඉක්මනින් ආපසු යාම

02 දවස මුළුල්ලෙහි ඇද හැළුණු **අනෝරා වැස්ස** නිසා නගරයෙහි මාර්ග වැසි ජලයෙන් යට විය.
(1) නැවැත්වීමක් නොමැති වැස්ස (2) මඳ වැස්ස
(3) වාරකන් වැස්ස (4) අගක් මුලක් නැති වැස්ස

03 **අත හයිය නම් බත නොවරදින** බව පැරැන්නන් පවසා ඇත.
(1) වැඩ කිරීමෙන් ලාභ උපයා ගත හැකි බව (2) සිඟමන් ඉල්ලීමෙන් ආහාර ලැබෙන බව
(3) උත්සාහය ඇත්නම් ජය ගත හැකි බව (4) කුඹුරු කෙටූ කල බත් ලැබෙන බව

- අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04 මාර්ටින් වික්‍රමසිංහ සූරීන් විසින් සිංහලයේ .................................. ගද්‍ය කාව්‍ය ලෙස ජාතක පොත හඳුන්වා දෙන ලදී.
(1) පුරාතන (2) සනාතන (3) නූතන (4) ආදිතම

05 නිවැරදි තීරණ ගැනීම සඳහා ............................................. බුද්ධිය ඉවහල් වේ.
(1) විමර්ශන (2) විවරණ (3) විදර්ශන (4) විචක්ෂණ

06 මහාචාර්ය ගුණපාල මලලසේකර මැතිතුමා කුඩා කල සිට ම මහත් ........................................ ජාතක පොත කියවූ බව සඳහන් වේ.
(1) රුචියකින් (2) අවධානයකින් (3) අභිරුචියකින් (4) අවබෝධයකින්

07 අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පෙළිය තෝරන්න.
(1) ඡේක, දක්ෂ, නිපුණ, විචක්ෂණ (2) ස්වර්ණ, හේම, කාංචන, කනක
(3) තිර, අචල, නිසල, නිශ්චල (4) හිමකර, සොම්, කලාපති, සිසි

08 සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
(1) ජාත්‍යනුරාගය, කරනවෑමියා, චතුරශ්‍රය, සණ්ටාරය
(2) ව්‍යංගාර්ථ, ශීඝ්‍රගාමී, කළමනාකරණය, පලඳනාව
(3) ධර්මිෂ්ඨ, ගිනිපෙණෙල්ල, ගැළපීම, ගැහැනු
(4) පලගැටියා, ප්‍රවීණ, මොනරාගල, රළපෙළ



EXAMRESULTS.LK

09 'අරුණ, ගණිතය, දවාල, පිඩැලි' යන වචනවල **දෙවෙනි අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) කෙටි ඇදය, කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල

(2) කෙටි පාපිල්ල, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි ඇදය

(3) කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කෙටි ඇදය, ඇලපිල්ල

(4) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල, කෙටි ඇදය

10 'සත' යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ

(1) දන්තජ ය. (2) කණ්ඨජ ය. (3) මූර්ධජ ය. (4) තාලුජ ය.

11 අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) වෛද්‍යවරියක්, ගොවීන්, ඔවුහු, මා (2) ළමයින්, මා, පෙදරේරුවරු, නාවිකයෝ

(3) වෛද්‍යවරියක, මිනිසුන්, ගුරුවරුන්, කුරුල්ලෙකු (4) මිනිසෙක්, අප, නිළියක, කුරුල්ලෙක්

12 'ජීවිතය ජයගත් පුතු ගැන සිතා අම්මා සතුටු කඳුළින් සිනාසෙන්නී ය.' යන වාක්‍යයේ 'කඳුළින්' යන්නෙහි විභක්තිය කුමක් ද?

(1) අවධි (2) කරණ (3) කර්ම (4) ආධාර

13 'සතුරු උවදුරු' යන්න අයත් වන්නේ

(1) විශේෂණ සමාසයට ය. (2) දකාරාර්ථ සමාසයට ය.

(3) විභක්ති සමාසයට ය. (4) අව්‍ය සමාසයට ය.

14 'ප්‍රසංග + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) ප්‍රාසංගික (2) ප්‍රසංගික (3) ප්‍රාසාංගික (4) ප්‍රසාංගික

15 මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) විධික්‍රියා - යවු, නරඹ, කරනු මැනවි, දුවපිය

(2) සන්ධි - ඔබිනොබ, සාහිත්‍යෝත්සවය, වංමුතු, කම්මුල

(3) සමාස - අතුරිකිලි, දරුසෙනෙහස, දිනකර, සුපසන්

(4) තද්ධිත - ධීමත්, රූමත්, කුල්මත්, සිරිමත්

16 මිශ්‍ර ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය කුමක් ද?

(1) ගායකයෝ ගී ගයා ප්‍රේක්ෂකයන් පිනවූහ. (2) විදේශිකයෝ වනයෙහි සිරි නරඹමින් ගමන් කරති.

(3) ළමයා පුස්තකාලයට ගොස් පොතක් කියවයි. (4) ගුරුවරු සෙනෙහසින් ශිෂ්‍යයින්ට ඔවදන් දෙති.

- **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

17 සිවුපද කාව්‍ය සම්ප්‍රදාය **අතික්‍රමණයක්** ලෙස නිසඳැස් පද්‍ය සම්ප්‍රදාය දැක්විය හැකි ය.

(1) ඉක්මවා යාම (2) මර්දනය කිරීම (3) ඉහළට යාම (4) පහළට යාම

18 සාහිත්‍යකරුවාගේ පරිකල්පනය ඔහුගේ නිර්මාණයෙන් **ප්‍රතීයමාන** වේ.

(1) ඉක්මවා යාම (2) මර්දනය කිරීම (3) ඉහළට යාම (4) පහළට යාම

19 ශ්‍රී ලාංකිකයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමේ **පරමාභිලාෂයෙන්**, ඔවුන් පෙළඹවීම සඳහා එස්. මහින්ද හිමියන් කළ නිර්මාණ බොහෝ ය.

(1) යටත් බවෙන් (2) උතුම් අරමුණෙන් (3) එකම හිතවත් බවෙන් (4) උතුම් ආශාවෙන්

20 දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය තෝරන්න.

(1) පුස්තකය, පුවත්පත, සඟරාව, වාර්තා ලිපිය

(2) සිවුපද කවි, නිසඳැස් කවි, සංදේශ කවි, ජන කවි

(3) ආතත, විතත, විතතාත, ත්‍රිශුලය

(4) කැත්ත, ගිරය, පිහිය, දුනු පිහිය

21 එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) සෙව්වන්දි - රෝස මල, දෘඪ - තද, ප්‍රභාතය - සන්ධ්‍යාව, පුදුමය - ආශ්චර්යය

(2) සින්දු - සාගරය, හසළත්වය - නිපුණත්වය, පාදප - වෘක්ෂ, ව්‍යසනය - විපත

(3) දොම්නස - තැවුල, පොළොව - වසුන්ධරා, ප්‍රහර්ෂය - කනගාටුව, සංස්ථිතිය - ව්‍යුහය

(4) සඳ - තරුපති, අරවින්ද - මානෙල්, විකසිත - මිණිමුතු, කඨෝර - කර්කශ

22 මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) හසළ - නිපුණ, පුහුණු, ප්‍රවීණ, හදාළ (2) සූර්යයා - දිනිඳු, දිනකර, රිවි, හිරු

(3) පෘථුල - පතළ, පැතිරුණු, විහිදුණු, ව්‍යාප්ත (4) හ්‍රස්ව - කෙටි, ලඝු, ගුරු, ලුහුඬු

23 **විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන** වරණය තෝරන්න.

(1) අභිමුඛ - සම්මුඛ (2) ආකුල - අනාකුල (3) උත්තම - අධම (4) චිරන්තන - අද්‍යතන

24 **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'ඔවුහු' යන්නෙහි අනුක්ත පදය 'ඔවුන්' යන්න යි.

(2) 'ම' යන්න නාසික්‍ය අක්ෂරයකි.

(3) 'මියුගුණු' යන්න විසන්ධි වනුයේ 'මීය + අගුණු' යනුවෙනි.

(4) 'තොමෝ' යන්න ස්ත්‍රී ලිංග ඒක වචන උක්ත පදයකි.

25 පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) නොපසුබට උත්සාහයෙන් කටයුතු කළ ඕ තොමෝ මෙවර විභාගයෙන් විශිෂ්ට ලෙස සමත් වූවා ය.

(2) සරසවියට නවක සිසුන් පැමිණෙන නිසා ජ්‍යෙෂ්ඨ සිසුහු නවකයින් සාදරයෙන් පිළිගනිති.

(3) වනාන්තරවලින් ලැබෙන ප්‍රයෝජන අතිමහත් බව වටහා ගැනීමෙන් මිනිස්සු වන සම්පත සංරක්ෂණය කරති.

(4) උද්‍යෝගයෙන් කටයුතු කිරීම උදෙසා ගොවීහු මේ කන්නයේ සරු අස්වැන්නක් ලැබූහ.

- **අංක 26, 27 යටතේ දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

26 අය මාර්ග මුළුමනින් ම නැති කර ගැනීම

(1) දඹුලු ගිහින් තල ගොයි මරනවා (2) ලෝකෙට පරකාසේ ගෙදරට මර ගාතේ

(3) අතු කඩා මොර කන්නා සේ (4) දී කිරට බළල්ලුත් සාක්ෂි

27 අඩු ආයාසයකින් වැඩි ප්‍රතිඵල බලාපොරොත්තු වීම

(1) බාගෙන කන්න තිබුණු වළ ඉහ ගෙන කෑම (2) උඳු වපුරා මුං බලාපොරොත්තු වන්නා සේ

(3) පොට්ට කාසිය සම්මාදම් වට්ටියට දැම්ම (4) නාකි වුණා ම යකත් තපස් රකී

28 ස්වරාදේශ සන්ධියට හා ආගම සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) තුනුවග, දෑගිලි (2) සුවාසූ, තුනුවග (3) සුවාසූ, දෑගිලි (4) දෑගිලි, සුවාසූ

- **අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

29 (1) නුඹලා අනාගත නායකයන් ලු. (2) දරුවෝ දෙමාපියන්ට කීකරු වීම මැනවි.

(3) සැකකරුවෝ සියලු දෙනා නිදහස් කරනු ලැබූහ. (4) සිසුහු පන්තියට පැමිණ නැත.

30 (1) නිලධාරීන් වැඩ කරති'යි බලධාරීන් සිතති. (2) මගීන් පාර පනිද්දී අනතුර සිදු වූ බව අම්මා කීවා ය.

(3) තරු පෙළ අහසේ බබළති. (4) අපි හෝ නුඹ පාඩම් කරමු.

31 * ගොවියාට තම නිර්මාණාත්මක චින්තනය ............................................ වගාව සරු කර ගත හැකි වෙයි.

* සිසුහු පිරිසක් සතුන් වත්ත නැරඹීම ................................................ අධ්‍යාපන චාරිකාවකට සහභාගි වූහ.

* පුරාණ ශ්‍රී ලංකාවේ මෙන්ම ඉන්දියාවේ ද ලේඛන ...................................... භාවිත වූයේ තල හා තල් ගස්වල කොළ ය.

* ලෝක සාමය ....................................... අධ්‍යාපනය දායක විය යුතු අයුරු ගැන අරුණාචලම් මහතා කරුණු දක්වා ඇත.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) පිණිස, නිසා, උදෙසා, සඳහා (2) සඳහා, උදෙසා, පිණිස, නිසා

(3) උදෙසා, සඳහා, නිසා, පිණිස (4) නිසා, පිණිස, සඳහා, උදෙසා

32 පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
''එයා පාසල් ගිහින් ඇවිල්ලා නැහැ.''

(1) ඇය පාසල් ගොස් පැමිණ නැත. (2) ඇ පාසල් ගොස් නොපැමිණියා ය.
(3) ඇ පාසල් ගොස් නොපැමිණියහ. (4) ඇ පාසල් ගොල් නොපැමිණියේ ය.

33 'කොකේසියන් චෝක් සර්කල් නාට්‍යයේ රචකයා වනුයේ,

(1) එදිරිවීර සරච්චන්ද්‍ර ය (2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය
(3) ඇන්ටන් චෙකොෆ් ය (4) හෙන්රි ජයසේන ය

34 ප්‍රබල සංකල්ප රූපයක් මවන කවි පදය ඇතුළත් වරණය තෝරන්න.

(1) දන පිනන සතර සඟරා වතින් සත සිත ගත සැනසේවා
(2) සුනෙර මතින් අලළන සඳ කිරි
(3) නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙඩි
(4) දොර ජනෙල් වසා සිර කළ කාමරයක ඇඳක් - පුටුවක් - මේසයක් - මම

35 ''ඇතැ කෝපයෙන් රත් වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජයැ'' යන පාඨයෙහි 'යවට' යන්නෙහි අර්ථය කුමක් ද?

(1) යකඩ බෝලයක් (2) යකඩ උලක් (3) යකඩ පට්ටමක් (4) යකඩ වළල්ලක්

36 පහත සඳහන් කවියේ දෙවෙනි පදය සම්පූර්ණ කරන්න.

වදිමින් සවස නල හැසිරෙන දිගතු වල
............................................................ ..............
පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල

(1) අතුළ කුසුම් විලසින් සැදෙන තුරුවැළ (2) පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
(3) සොබමන් සුනිල් මිණි නිල් නුබ තුර විපුල (4) උදුළ සොමි කැලුම් නිසයුරු හිමි පුවළ

37 පිරුවානා පොත් වහන්සේ

කනප්පුවේ පෙරලී ඇත
මිදුල පුරා වියළුණ කොළ
ඒ මේ අත විසිර තිබේ
මිදුලෙ පහන් පැලේ නිතර
සැලුණු දැල්ල නිවී ගොස් ය
ඉඳ හිට ගේ පිළිකන්නේ
බල්ලකු උඩු බුරනු ඇසේ

ඉහත සඳහන් කවියේ රචකයා වනුයේ

(1) මහගමසේකර ය (2) රත්න ශ්‍රී විජේසිංහ ය (3) ඒ. වී. සුරවීර ය (4) විමල් දිසානායක ය

38 දිගාමඬුලු ප්‍රදේශය ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'මුම්මාරිය' යනු

(1) වැව් දියෙන් වැඩ කරන කුඹුරු (2) අහස් දියෙන් වැඩ කරන කුඹුරු
(3) ගංගා දියෙන් වැඩ කරන කුඹුරු (4) වාරිමාර්ග දියෙන් වැඩ කරන කුඹුරු

39 'වැහි වලාකුළ පෑ කළු යැයි ඔබේ
නොහොබිති' යි කිසි ලෙස් නො සතොස් නොවන්
සිරුර පැයෙනු ගත් සුදනෝ ලොවේ
නොහඳුනත් උතුමන් ගුණයෙන් විනා''

මෙම කවියෙන් කියවෙන අදහස වන්නේ

(1) පුද්ගලයා ගැන ය. (2) වැස්ස ගැන ය. (3) සොබාදහම ගැන ය. (4) අසතුට ගැන ය.

40 පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.
''භාෂාව මානව සංස්කෘතියේ පදනම වශයෙන් සැලකෙයි. මිනිසා සත්ත්ව ලෝකයේ සෙසු සාමාජිකයන්ට වඩා විශිෂ්ට තත්ත්වයක් අත් පත් කර ගෙන ඇත්තේ ද භාෂා ශක්‍යතාව හේතුවෙනි.''

(1) මිනිසා සත්ත්ව ලෝකයේ අනෙක් සත්ත්වයින්ට වඩා විශිෂ්ට තත්ත්වයක් අත් පත් කර ගෙන ඇත්තේ භාෂාව මානව සංස්කෘතියේ පදනම නිසායි.
(2) මානව සංස්කෘතියේ පදනම වන්නේ භාෂාව නිසා අනෙක් සත්ත්වයින්ට වඩා විශිෂ්ට තත්ත්වයක් මිනිසා ලබා ගෙන ඇත.
(3) මානව සංස්කෘතියේ පදනම වන්නේ භාෂාවයි. අනෙක් සත්ත්වයින්ට වඩා විශිෂ්ට තත්ත්වයක් මිනිසා ලබා ගෙන ඇත්තේ භාෂා හැකියාව නිසායි.
(4) මිනිසා සත්ත්ව ලෝකයේ සෙසු සාමාජිකයන්ට වඩා විශිෂ්ට තත්ත්වයක් අත් පත් කර ගෙන ඇත්තේ භාෂාව මානව සංස්කෘතියේ පදනම වන භාෂා හැකියාව නිසායි.

(ලකුණු 1 x 40 = 40 යි.)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

21 | S | I,II

තෙවන වාර පරීක්ෂණය 2020
Third Term Test 2020

11 ශ්‍රේණිය
Grade 11

සිංහල භාෂාව හා සාහිත්‍යය I-II
Sinhala language and literature I-II

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

---

- **අංක (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(01) (i) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
''ශ්‍රී ලංකාවේ මානව හා භෞතික සම්පත් කලමනාකරණය මගින් සමස්ථ සංවර්ධන ක්‍රියාවලිය ඉහළ නැංවිය හැකි ය.''

(ii) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.
(අ) සුළැඟිල්ල (ආ) බහ්වර්ථ

(iii) පහත සඳහන් වාක්‍යවල ඇතුළත් තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියාපද වර්ගය ලියන්න.
(අ) කරුණාකර බසයෙහි ඉදිරියට **යන්න**.
(ආ) සෞඛ්‍ය උපමාන **නොපිළිපැද්දොත්** කොවිඩ් 19 වැලඳිය හැකි ය.

(iv) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් **නිපාත පද දෙකක්** උපුටා ලියන්න.
සාහිත්‍යය වූ කලි සභ්‍යත්වයෙහි වැඩීම බස දන්නවුන්ට පමණක් ඇසෙන සේ කියන්නකි.

(v) පහත සඳහන් පද අයත් වන සමාස ප්‍රභේදය ලියන්න.
(අ) කිරිබත් (ආ) අනවශ්‍ය

(vii) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) ගුරුවරු ළමයි හා බාහිර ක්‍රියාකාරකම් කරති.
(ආ) සිසුහු විවාදයේ දී හොඳින් කරුණු ඉදිරිපත් කළහ'යි ගුරුවරු පැවසූහ.

(vii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
(අ) වටිනාකම තීරණය කිරීම (ආ) කිසිවකට දෙවෙනි නොවන

(viii) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි හෝ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
(අ) කනිෂ්ඨ සොහොයුරා (ආ) සුන්දර දසුන

(ix) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.
(අ) පැල (ආ) පැළ

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවා නැවත ලියන්න.
(අ) ශිෂ්‍යයා විසින් පොත් බලා රචනායට කරුණු රැස් කරන ලදී.
(ආ) කැබිනට් ප්‍රකාශක විසින් කැබිනට් තීරණ මාධ්‍ය වෙත දැනුම් දෙනු ලබයි. (ලකුණු 2 x 10 = 20)

(02) පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250** කට **නොඅඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) ස්වාභාවික පරිසරය මිනිසාගේ පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයකි. එහෙත් නීත්‍යනුකූල නොවන ආකාරයෙන් සිදුකෙරෙන වනාන්තර විනාශ කිරීම, වැලි ගොඩ දැමීම සහ පහත් බිම් ගොඩකිරීම වැනි මානව ක්‍රියාකාරකම් නිසා දිනෙන් දින ස්වාභාවික පරිසරය විනාශ වෙමින් පවතී. සංවර්ධනයේ නාමයෙන් ස්වාභාවික පරිසරය විනාශ කිරීම මගින් මුළු මහත් සමාජයේ ම පරිහානිය සිදුවන බව නොඅනුමානය.

(ආ) ආකල්ප දියුණු කිරීම තරම් ජාතියක් නංවාලීමේ වෙනත් ක්‍රියාමාර්ගයක් නැත. දියුණු ආකල්ප යනු දියුණු ජාතියක සමාරම්භයයි. 'සෞභාග්‍යයේ දැක්ම' නිර්මාණය වන්නේ ම ආකල්ප දියුණුව උදෙසා ය. එහි දිගුවක් ලෙසින් ක්‍රියාත්මක 'නැවත අරඹමු මහමඟ විනය' අපගේ සුබ සිද්ධිය සඳහා මිස අන් යමක් වෙනුවෙන් නොවේ. රියැදුරන්, පදිකයන්, මගීන් විනයවත් වීම නිසා රටට වන ප්‍රතිලාභය ගණනය වන්නේ භෞතික පදනමෙන් පමණක් නොවේ, මානව සම්පත ද සුරැකීමෙනි.

(ඉ) කොවිඩ් 19 වෛරසය මුළු ලෝකයම භීතියට පත් කර හමාරය. දියුණු රටවල් පවා මෙම වෛරසය හමුවේ පරාජයට පත් වී ඇත. බටහිර වෛද්‍ය ක්‍රමයෙන් පවා මේ වන තෙක් ඖෂධයක් සොයා ගෙන නැත. මෙම වසංගතයෙන් ආරක්ෂා වීමට නම් කළ යුත්තේ එකිනෙකා තනි තනිව ආරක්ෂිත උපක්‍රම අනුගමනය කිරීම පමණයි. මෙකී වසංගතය මර්දනය කිරීමට නම් ජනතාවක් විදියට එකිනෙකා ම වගකීම භාරගත යුතුව ඇත.

(ඊ) මානව සංහතියෙහි ප්‍රගමනයට හේතු වී ඇත්තේ සංස්කෘතියයි. සංස්කෘතික මිනිසා තුළ තාක්ෂණය, කලාව සහ සාහිත්‍යය ආදි විවිධ අංග ගැබ් වී ඇත. එහෙත් වර්තමානයේ දී තාක්ෂණය ප්‍රබල වුවත් කලාව, සාහිත්‍යය ආදියෙහි පසුගාමී බවක් දක්නට ඇත. පාසල් අධ්‍යාපනයේ දී පවා කලාව, සාහිත්‍යය ආදිය කෙරෙහි දක්වන ආකල්පය පහත් මට්ටමක ඇත. මේ තත්ත්වය මත එකිනෙකාට ආදරය නොකරන එකිනෙකාට ගරු නොකරන එකිනෙකා නොහඳුනන සමාජයක් නිර්මාණය වීමට හැකි ය.

(ලකුණු 25 යි.)

(03) පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ජාති, ආගම්, භාෂා, ලිංග, සංස්කෘතික භේදයකින් තොරව සමාජයේ සියලු ම දෙනාට අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව සැමට අධ්‍යාපනය යන්නෙන් අදහස් කෙරේ. මෙහි ප්‍රභවය මධ්‍යතන යුගයෙන් පසු යුරෝපයේ ඇති වූ ප්‍රංශ මහා විප්ලවය, රුසියන් විප්ලවය, කාර්මික විප්ලවය වැනි දෑ තුළින් එවකට පැවති සමාජ ක්‍රම බිඳ වැටීම දක්වා ඈතට දිව යයි. සමාජ, ආර්ථික, දේශපාලන වශයෙන් ඇති වූ මෙකී විපර්යාස හේතු කොට ගෙන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම එම රටවල බිහි විය. ඒ සමග ම නිදහස හා සමානාත්මතාව පිළිබඳ අදහස් ද අවධාරණය කෙරිණි. අධ්‍යාපනය සම්බන්ධයෙන් ද වෙනස්කම් ඇති කිරීමට ඉවහල් වූයේ මේ පසුබිමයි. සමාජයේ සැම දෙනෙකුට ම අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අවස්ථාව සැලසීම වැදගත් සිද්ධාන්තයක් ලෙස පිළිගැනුණු හෙයින් ''සැමට අධ්‍යාපනය'' යන සංකල්පය බිහි විය. විශේෂයෙන් 1945 දී යුනෙස්කෝව පිහිටුවීමෙන් පසුව රට රටවල අධ්‍යාපනය සංවර්ධන කරනු සඳහා ඉන් ඉටු වූ සේවය අති විශාල ය. යථෝක්ත ආයතනය වරින් වර පත් කරන ලද ජාත්‍යන්තර අධ්‍යාපන කොමිෂන් සභා ඔස්සේ 'සැමට අධ්‍යාපනය' යන සංකල්පය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම හා අවශ්‍යතාව අවධාරණය කරන ලද්දේ ය. 1972 දී යුනෙස්කෝව විසින් පත් කරන ලද අධ්‍යාපන කොමිෂම මගින් 'දිවි පැවැත්මට ඉගෙනුම' අද සහ හෙට ලෝකය නම් වූ 1972 මැයි මාසයේ දී නිකුත් කරන ලද අතර එමගින් ජය ගත යුතු ඉලක්ක හා බාධක මැනවින් ඉදිරිපත් කොට තිබිණ. (ලකුණු 10 යි.)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

කියවීම, ඉගෙනුමේ යතුර වශයෙන් සලකනු ලැබේ. ඒ අනුව කියවීම සමස්ත අධ්‍යාපන ක්‍රියාවලියේ ම ආරම්භයේ සිට අඛණ්ඩව ඉදිරියට යන ක්‍රියාපිළිවෙළකි. කියවීම ප්‍රධාන වශයෙන් පාසල් පද්ධතිය තුළ අංශ දෙකක් යටතේ වර්ග කෙරේ. එනම්, කියවීමට ඉගෙනීම හා ඉගෙනුමට කියවීමයි. කියවීමට ඉගෙනුම මූලික වශයෙන් ප්‍රාථමික ශ්‍රේණි සඳහා ද, ඉගෙනුමට කියවීම ද්විතීයික ශ්‍රේණි සඳහා ද භාවිත වේ. ඉගෙනුමට කියවීම ගත් විට ඒ සඳහා පාසල් පුස්තකාල එකතුව ප්‍රබන්ධ හා ප්‍රබන්ධ නොවන වශයෙන් වර්ග දෙකකට වෙන්ව පවතී. මින් ප්‍රබන්ධ කියවීම මගින් වින්දනීය ක්ෂේත්‍රය දියුණු වන අතර ඉන් මිනිස් මොළයේ දකුණු අර්ධයේ අන්තර්ගත සංකල්පවල සංවර්ධනයක් බලාපොරොත්තු වේ. විෂය පොත් කියවීම මගින් සමබර පෞරුෂයකින් යුත් ශිෂ්‍ය ප්‍රජාව පාසල් පද්ධතිය තුළින් බිහිකිරීම අපේක්ෂිත ය.

(i) සමස්ත අධ්‍යාපන ක්‍රියාවලියෙහි අඛණ්ඩව ඉදිරියට යන ක්‍රියාවලිය කුමක් ද?
(ii) කියවීම වර්ග දෙකකි. ඒ මොනවා ද?
(iii) සමබර පෞරුෂයකින් යුත් ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කිරීමට අපේක්ෂා කරන්නේ කෙසේද?
(iv) පුස්තකාල එකතුව වර්ග දෙකකි. ඒ මොනවා ද?
(v) වින්දනීය ක්ෂේත්‍රය දියුණු වීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද? (ලකුණු 10 යි.)

(05) පහත දැක්වෙන විස්තර පදනම් කර ගෙන **පුවත් පත් වාර්තාවක්** සකස් කරන්න.

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ගැළපෙන ආකාරයෙන් වෘත්තීය අධ්‍යාපනය සකස් විය යුතු බව බොහෝ විද්වතුන්ගේ අදහස වී ඇත. පාසල් අධ්‍යාපනය නිමාවට පත් කර පාසලෙන් බැහැරව යන දරුවන් සඳහා ඔවුන්ගේ කුසලතාව අනුව සැලසුම් සහගත වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීමෙන් රැකියා වියුක්තිය අඩු වනු ඇත. රටේ ආර්ථිකයට ගැළපෙන ආකාරයෙන් ශ්‍රම බලකායක් බිහි කිරීමේ වැදගත්කම පෙන්වා දීමට පුවත් පතකට වාර්තාවක් සකස් කරන්න.

**නැතහොත්**

පහත දැක්වෙන විස්තරය පදනම් කර ගෙන **අත් පත්‍රිකාවක්** සකස් කරන්න.

රට අවදානමකට ලක්ව ඇති මේ අවස්ථාවේ දී කොවිඩ් 19 වසංගතයෙන් ඔබ ප්‍රදේශය රැක ගැනීම සඳහා මහජනතාව දැනුම්වත් කිරීමට අදාළ සෞඛ්‍ය මාර්ගෝපදේශ ඇතුළත් අත් පත්‍රිකාවක් සකස් කරන්න. ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ඔබ යයි සිතන්න. (ලකුණු 15 යි.)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

21 S III

තෙවන වාර පරීක්ෂණය 2020
Third Term Test 2020

11 ශ්‍රේණිය
Grade 11

සිංහල භාෂාව හා සාහිත්‍යය - III
Sinhala language and literature - III

පැය දෙකයි
Two hours

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) ''දේවයන් වහන්ස, සෘද්ධිමත් කෙනෙකුන් ආකාශයෙන් ගොස් වදුත් මුත් මිනිසුන් විසින් මේ නුවර වදනා තබා සිතන්නටත් බැරි ය.''
   (අ) මෙම ප්‍රකාශය කළෝ කවරහු ද?
   (ආ) මෙහි සඳහන් වන නුවර කුමක් ද?

(ii) (අ) සිංහබාහු නාට්‍යය කිනම් නාට්‍ය සම්ප්‍රදායකට අයත් ද?
   (ආ) එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත නවකතා දෙකක් නම් කරන්න.

(iii) ..........................................................................................
..........................................................................................
ගොල්ල සමග එති ඌරෝ      හැමදාම
නිල්ල අඹති සත් දවසින්      බැලුවාම
   (අ) මෙම කවියෙහි ඉතිරි පේළි දෙක සම්පූර්ණ කරන්න.
   (ආ) මෙම කවියෙහි **නිල්ල අඹති** යන්නෙහි අර්ථය ලියන්න.

(iv) ''මුන් වහන්සේ සිනාවක් සී-පී සේක. විද්දත් කමෙක් වනැ.''
   (අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
   (අ) මෙහි සඳහන් පරිදි උන් වමන්සේ සිනාසුණේ කවර හේතුවක් නිසා ද?

(v) (අ) වස්සානය පද්‍ය පන්තිය ඇතුළත් කාව්‍ය කෘතිය නම් කරන්න.
**කුඹුක් අතු වතුර අත ග ගා නැමිලා**      දියට
දිය කෙළින හැටි පුංචි මාළුවෝ      දුටුවා ද
   (ආ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අදහස ලියන්න.

(vi) (අ) දියමන්ති මාලය කෙටිකතාව කාගේ නිර්මාණයක් ද?
   (ආ) එය සිංහලයට පරිවර්තනය කළේ කවුරුන් විසින් ද?

(vii) මිහඹ මුව මඬල මෙන් දිලෙන හැම      විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර      සිට
කිරඹ පොකුරු මී රස ලැබ බොන      ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු      කොට
   (අ) මෙම පද්‍යය අඩංගු මුල් කෘතිය නම් කරන්න.
   (ආ) තෙවැනි පද්‍ය පාදයෙන් කියැවෙන පරිදි විහාරය නරඹන්න යයි කියන්නේ කෙසේ ද?

(viii) (අ) ස්වභාව සෞන්දර්යය හා බැඳුණ කවි ආර හේතුවෙන් 'සිංහල ෂෙලී' ලෙස ප්‍රකට වූ කවියා කවුරුන් ද?
**කලදෝ දියෙන් පොගවා රන් පුලින      තලා**
සංගීතවත් වී යම් ඉදිරියට      ගලා
   (ආ) ඉහත පද්‍ය කොටසේ තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය ඛණ්ඩයේ අර්ථය ලියන්න.

(ix) ''ඇයි මෝඩියෙ මොකක්ද ඒ මිනිහට කියාපු නම ?''
   (අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
   (ආ) **ඒ මිනිහට** යනුවෙන් මෙහි සඳහන් වන්නේ කවුද?

(x) නිදහස මහ මුහුදක්      වේ
එහි උල්පත පුත නුඹ      වේ
ඒ බව සිහි කොට      මෙලොවේ
යුතුකම ඉටු කළ යුතු      වේ

(අ) ඉහත පද්‍යය අඩංගු මුල් කෘතිය නම් කරන්න.
(ආ) තෙවැනි පද්‍ය පාදයෙන් කියැවෙන පරිදි විහාරය නරඹන්න යයි කියන්නේ කෙසේ ද?

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ''එක් සියයක් රජ දරුවෝ ඒ මහතාණන් වහන්සේගේ **රූපෛශ්වර්යය** දැක, 'නුවණින් සියලු දඹදිව තමන්ට දෙවන කෙනෙකුන් නැති. සිරිවඩ්ඪන සිටාණන් පුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝ නම් මොහු යැ'යි **සමාධීන්** ඔල්වර හඬ සිය ගණන් පැවැත්වූහ.
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) වල දින අදහසින් මෙන් සුර ගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන
වෙල ළස ගැවසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එය සඳැ උතුරින් පෙනෙන
(අ) මෙම කවියේ දෙවැනි පදයේ **ල, ළ** අක්ෂර කීපවරක් එක ළඟ යොදා ගැනීම නිසා මතු වන කාව්‍ය රසය කුමක් ද?
(ආ) කවියා මෙහිදී මුහුදේ ස්වභාවය විස්තර කර ඇති ආකාරය දක්වන්න.

(iii) ''මහ තෙරුන් හිඳ සස් කළ තන්හි පිළක් කළහ. **මූඪගර්භ** වූ තිරිසන් ගතියැ සත්හු දූ ඇරැ එහි හොවති. එ විගස මැ සුවයෙන් බර මුසිත්. යමක් දුර්බල ද ගෙන එන්නට නොහැකි ද, ඇයට පිළ දෙවි දිය ඇරැ **හිසැ ඔත් කලැ** එකෙණෙහි ම බර මුසී.''
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) මෙහි දැක්වෙන විස්මය දනවන සිදුවීම කුමක් ද?

(iv) නොයෙක් තැන ම පිපි මල් පිරුණු පොකුණුය
ගෙයක් කන ම සැදූහෙන් දෙවන දකුණුය
සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණුය
සියක් අය කෙරෙති වැඳ පුද පැදකුණුය
(අ) මෙම කවියේ සඳහන් පරිදි ජනතාවගේ බැතිමත් බව පෙන්වන කරුණු **දෙකක්** ලියන්න.
(ආ) කවියේ සඳහන් උපමාලංකාරය දක්වන්න.

(v) යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කැර එකසී
අහසින් බැස රඟ ගත් රඟ කෙලෙසී
දිසි මෙන් විය විදුලිය සිය දහසී
(අ) **දෙවඟනන්** හා **ඒකාන්තයෙන්** යන පද සඳහා කවියා භාවිත කර ඇති වචන දෙක ලියන්න.
(ආ) කවියේ සඳහන් උපමාලංකාරය දක්වන්න. (ලකුණු 4 x 5 = 20 යි.)

(03) (අ) උපයුක්ත කරගත් බස් වහරේ සුවිශේෂීභාවයත්
(ආ) අවස්ථා හා සිද්ධි නිරූපණයේ දී පෑ සමත්කමත්
නිසා අඟුල්මල් දමනය රසවත් සාහිත්‍ය නිර්මාණයක් වී ඇත. උදාහරණ **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(අ) ස්වභාවෝක්ති වර්ණනයට කවියා පෑ දක්ෂතාවත්
(ආ) අවස්ථාවට ගැළපෙන පරිදි උපමා රූපක භාවිතයත් නිසා
මඟ විසිතුරු පැදි පෙළ පාඨක සිත් සතන් ඇද බැඳ ගනී. එක් කරුණකට නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි.)

(04) දැතේ කරගැට සිඹ සනසන්නට පැදි පෙළේ සාර්ථකත්වයට කවියා
(අ) අතීත ශ්‍රී විභූතියත්
(ආ) ජාතිකාභිමානය දනවන ප්‍රාර්ථනාත්
ඉවහල් කරගත් අයුරු එක් කරුණකට නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

හානා හීය පානා අඬහැරෙන් දූනේ පැදි පෙළේ අගනාකම ඉස්මතු වන්නේ,
(අ) ඒවා සර්වකාලීන වටිනාකමකින් යුක්ත වීමත්
(ආ) උපදෙස් ලබා දීම සංයමයෙන් යුක්ත ව සිදුකිරීමත්
යන කරුණු නිසා ය. එක් කරුණකට උදාහරණ **දෙකක්** බැගින් විමසන්න. (ලකුණු 15 යි.)

- **05, 06, 07 ප්‍රශ්නවලින් <u>එකකට පමණක්</u> පිළිතුරු සපයන්න.**

(05) මැටිල්ඩා ලොයිසල් තාත්වික කාන්තා චරිතයක් ලෙස නිරූපණය කිරීම 'දියමන්ති මාලය' සාර්ථක කෙටිකතාවක් වීමට ඉවහල් වී ඇත. උදාහරණ **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි.)

(06) පවුල් ඒකකය රැකගැනීමට යත්න දරන විශිෂ්ට මවක ලෙස සුප්පාදේවියගේ චරිතය හඳුනාගත හැකි ය. සිංහබාහු නාට්‍යයේ නිර්දිෂ්ට කොටසින් සුදුසු නිදසුන් **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

(07) කුරහන් ඉසිමුව බලාලා පද්‍ය පන්තිය තුළින් ඉස්මතු වන ජනකාව්‍ය ලක්ෂණ නිදසුන් **තුනක්වත්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 10 යි.)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (4) | 11 - (3) | 21 - (2) | 31 - (4) |
| 2 - (1) | 12 - (2) | 22 - (4) | 32 - (1) |
| 3 - (3) | 13 - (3) | 23 - (1) | 33 - (2) |
| 4 - (2) | 14 - (1) | 24 - (3) | 34 - (4) |
| 5 - (4) | 15 - (4) | 25 - (1) | 35 - (1) |
| 6 - (3) | 16 - (2) | 26 - (3) | 36 - (3) |
| 7 - (1) | 17 - (1) | 27 - (2) | 37 - (4) |
| 8 - (2) | 18 - (4) | 28 - (4) | 38 - (2) |
| 9 - (4) | 19 - (2) | 29 - (3) | 39 - (1) |
| 10 - (1) | 20 - (3) | 30 - (2) | 40 - (3) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 40 කි.)

## II කොටස

(01) (i) කළමනාකරණය / සමස්ත

(ii) (අ) සුළු + ඇඟිල්ල  (ආ) බහු + අර්ථ

(iii) (අ) විධි ක්‍රියා  (ආ) අසම්භාව්‍ය ක්‍රියා

(iv) වූ කලි, පමණක්, සේ

(v) (අ) විභක්ති සමාසයට (කරණ විභක්ති සමාසය)  (ආ) අව්‍යය සමාසය

(vi) (අ) ගුරුවරු ළමයින් හා බාහිර ක්‍රියාකාරකම් කරති.

(ආ) සිසුන් විවාදයේ දී හොඳින් කරුණු ඉදිරිපත් කළහ'යි ගුරුවරු පැවසූහ.

(vii) (අ) තක්සේරුව  (ආ) අද්විතීය

(viii)(අ) කනිෂ්ඨ සහෝදරයා / කනිටු සොහොයුරා  (ආ) සුන්දර දර්ශනය / සොඳුරු දසුන

(ix) අදාළ පිළිතුරට ලකුණු දෙන්න.

(x) (අ) ශිෂ්‍යයා පොත් බලා රචනාවට කරුණු රැස් කළේ ය.

(ආ) කැබිනට් ප්‍රකාශක කැබිනට් තීරණ මාධ්‍ය වෙත දැනුම් දෙයි.  (ලකුණු 2 x 10 = 20 යි.)

(02) රචනා මාතෘකාව අනුව කරුණු ගළපා ඇත්නම් උපරිම ලකුණු ලබා දෙන්න.  (ලකුණු 25 යි.)

(03) * කිසිම භේදයකින් තොරව සැමට අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව සැමට අධ්‍යාපනයයි.

* යුරෝපයේ ඇති වූ විපර්යාස නිසා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම බිහිවීම.
* නිදහස හා සමානාත්මතාවය අගය කිරීම.
* සැමට අධ්‍යාපනය යන සංකල්පය බිහිවීම.
* ජාත්‍යන්තර අධ්‍යාපන කොමිෂන් සභා මගින් ද සැමට අධ්‍යාපනය යන සංකල්පය අවධාරණය කිරීම.

(ලකුණු 10 යි.)

(04) (i) කියවීම

(ii) කියවීමට ඉගෙනුම, ඉගෙනුමට කියවීම

(iii) විෂය පොත් කියවීම මගින්

(iv) ප්‍රබන්ධ හා ප්‍රබන්ධ නොවන

(v) සංකල්ප සංවර්ධනය  (ලකුණු 10 යි.)

(05) නිවැරදි පිළිතුරට උපරිම ලකුණු ලබා දෙන්න.  (ලකුණු 15 යි.)

## III කොටස

(01) (i) (අ) චූලනී බ්‍රහ්මදත්ත රජුගේ යෝධයන්

(ආ) මියුලු නුවර / මිථිලා රාජධානිය

(ii) (අ) ශෛලිගත නාට්‍ය සම්ප්‍රදායට

(ආ) මළගිය ඇත්තෝ, මළවුන්ගේ අවුරුදු දා

(iii) (අ) එල්ල වෙන්ට කවි කර කීවෙමි  බොහොම

කොල්ල කන්ට එති සිවුපාවෝ  බොහොම

(ආ) නිල් පැහැ ගැන්වෙති

(iv) (අ) බරණැස් නුවර එක්තරා කුල දුවණියක්
(ආ) බරණැස් නුවර කුල දුවණියගේ සැමියාගේ ප්‍රාර්ථනාව එලෙසින් ම ඉටු වන බව දැක
(v) (අ) වස්සානේ
(ආ) ගං දියට පත් වූ කුඹුක් අතු ගං දියෙහි ගැවෙමින් පවතී
(vi) (අ) ගී ද මෝපසං
(ආ) කේ. ජී. කරුණාතිලක
(viii)(අ) එච්. එම්. කුඩලිගම
(ආ) රිදී වන් ජලයෙන් රන්වන් වැලිතලා පොඟවා
(ix) (අ) හිරපල්ලා
(ආ) බබුන්ට
(ix) (අ) නිදහස මහ මුහුදක්
(ආ) ඔවා මුතු (ලකුණු 2 x 10 = 20 යි.)

(02) (i) (අ) රූපෛශ්වර්යය - රූ සම්පත / රූප සම්පත්තිය
සමාධීන් - සතුටින්
(ආ) ධර්ම යුද්ධය සඳහා මහෞෂධ පඬිතුමා පැමිණෙන තුරු කේවට්ටයන් බලා සිටියදී මහෞෂධ පඬිතුමා ගාම්භීර අයුරින් ඊට පැමිණි අවස්ථාව
(ii) (අ) අනුප්‍රාසය